Archaeologia (2006) : 95 - 102

# කෞතුකාගාර විද්‍යාව සහ ශ්‍රී ලංකාවේ කෞතුකාගාර

රංජිත් හෙට්ටිගේ
ජාතික කෞතුකාගාරය, කොළඹ

## හැඳින්වීම

ලෝකයේ රාජ්‍ය මට්ටමින් කෞතුකාගාර ආරම්භ වී සියවස් තුනකට වඩා අධික කාලයක් ගත වී ඇත. ගෙවී ගිය දශක තුනක කාලය යුරෝපයේත් අප්‍රිකාවේ සහ ආසියාවේ කෞතුකාගාරවල සමස්ත ක්‍රියාවලිය ඉතා සීඝ්‍ර වශයෙන් විද්‍යානුකූල පදනමක් යටතේ වර්ධනය වී ඇති බව හඳුනාගත හැකිය. වර්තමානය වන විට කෞතුකාගාර සමාජ සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනයක් හැටියට පිළිගෙන තිබේ. 1946 වර්ෂය වනවිට යුනෙස්කෝ ආයතනය ලෝකයේ කෞතුකාගාර වෙනුවෙන් ජාත්‍යන්තර කෞතුකාගාර සංවිධානය පිහිටුවනු ලැබීය. මේ වන විට ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් මෙම සංගමයේ සාමාජිකත්වය ලබා ඇති අතර ශ්‍රී ලංකාව ද ඉන් එක් රටකි. 1974 වර්ෂයේ දී ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය (International Council of Museums) මගින් කෞතුකාගාර යනු කුමක් ද යන්න අර්ථ නිරූපණය කර තිබේ. මෙම ලිපියේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකීය කෞතුකාගාරයන්හි කාර්ය පිළිබඳ විමසීමකි.

## කෞතුකාගාරයක ප්‍රධාන කාර්යය

"මිනිසා හා මිනිසාගේ පරිසරය පිළිබඳ ද්‍රව්‍යමය සාක්ෂි අත්පත් කරගන්නා වූ, සංරක්ෂණය කරන්නා වූ පර්යේෂණ පවත්වන්නා වූ හා ප්‍රදර්ශනය කරන්නා වූ ද මහජනයාගේ අධ්‍යයනයට, අධ්‍යාපන හා සන්තුෂ්ටිය සඳහා විවෘතව පවතින සමාජ සේවයට හා දියුණුවට පවත්වාගෙන යනු ලබන ලාභ නොලබන ස්ථිර ආයතන කෞතුකාගාර වශයෙන් හැඳින්විය හැකි ය"

උක්ත අර්ථ නිරූපණය සැලකිල්ලට ගත් කළ ලෝකයේ බොහෝ රටක පිහිටුවා ඇති කෞතුකාගාර තම රටවල තිබෙන සංස්කෘතිය හා ස්වභාවික උරුමයට අදාළ සාක්ෂි වෙනුවෙන් විවිධාකාරයෙන් ක්‍රියා කරන ආයතන හැටියට හඳුනාගත හැකි ය. ඒ අනුව කෞතුකාගාර විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් පහත සඳහන් ආකාරයට විස්තර කළ හැකි ය

1. භාණ්ඩ එක්රැස් කිරීම
2. සංරක්ෂණය කිරීම
3. පර්යේෂණ කිරීම
4. ප්‍රදර්ශනය කිරීම
5. අධ්‍යාපනය ලබාදීම
6. ලේඛනගත කිරීම
7. ආරක්ෂාව

මේ වනවිට ලෝකයේ බොහෝමයක් රටවල රාජ්‍ය මට්ටමින් පාලනය වන කෞතුකාගාරවල සහ ඇතැම් පෞද්ගලික කෞතුකාගාරවලත් උක්ත කාර්යයන් සඳහා විනයානුකූලව යොදාගත හැකි උපරිම ක්‍රමවේදයන් භාවිතයට ගනිමින් ඒ ඒ කාර්යයන් ප්‍රමිතියක් යටතේ ඉටුකරනු ලැබේ. විශේෂයෙන් මේ ඉහත සඳහන් කාර්යයන් සඳහා නිශ්චිත හඳුනාගත් ප්‍රතිපත්තියක් තුළ කටයුතු කිරීම නිසා යුරෝපයේ බොහෝ රටවල කෞතුකාගාර සම්බන්ධව අත්‍යවශ්‍ය වූ ආයතන වශයෙන් පමණක් නොව ඓතිහාසික, කලාත්මක, ස්වභාවික, විද්‍යාත්මක සහ තාක්ෂණික යන අංග පිළිබඳ අධ්‍යයනය හා ආශ්වාදය ලැබිය හැකි ඉතා වැදගත් විද්‍යාස්ථාන බවට පත්ව තිබේ. ඒ රටවල මේ දියුණුව කොතරම් ද කියතොත් ඒවායෙහි කෞතුකාගාර විශ්වවිද්‍යාල මට්ටමේ පර්යේෂණ ආයතනයන් ය. එසේ නැතහොත් විශ්වවිද්‍යාල සහ කෞතුකාගාර අතර ප්‍රායෝගික වශයෙන් ඉතා කිට්ටු සබඳතාවයක් පවතී.

## ජාතික උරුමයන්

රජය මට්ටමින් කෞතුකාගාර ආරම්භ වී වසර 125 ක් ගතවන ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන තත්ත්වයන් ජාත්‍යන්තර වශයෙන් සැලකීමේ දී සුවිශේෂ අවධානයක් යොමු කළ යුතුය. ශ්‍රී ලංකාවේ කෞතුකාගාර සඳහා ප්‍රතිපත්තියක් ද පිහිටුවා මේ කෞතුකාගාර ජාලයක ස්වභාවයෙන් සංවිධානය කිරීම ද ඒ සෑම කෞතුකාගාරයක් ම ප්‍රතිසංවිධානය කිරීම සහ වෘත්තීය මට්ටමින් කෞතුකාගාරවේදීන් පුහුණු කර ගැනීම යන කාරණා පිළිබඳව අපගේ දැඩි අවධානය යොමුවිය යුතුය. ඵලදායී ලෙස සමාජ සංවර්ධනයට කෞතුකාගාර දායක කරගත හැකි වන්නේ උක්ත කාරණා සැලකිල්ලට ගෙන ඉතා ඉක්මනින් ඒ සඳහා අවශ්‍ය වන දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් සකස් කිරීමෙනි.

ශ්‍රී ලංකාවේ තිබෙන සංස්කෘතික හා ස්වභාවික උරුමයට අදාළ කෞතුක වස්තු සහ ස්වභාවික විද්‍යා ආදර්ශක වලින් සැලකිය යුතු ප්‍රමාණයක් කෞතුකාගාරවල තැන්පත් වී ඇත. එහිදුත් ජාතික කෞතුකාගාරවල තිබෙන සම්පත් ප්‍රමාණය අති විශාලය. එනී

ජාතික උරුම සම්පත් විධිමත් ලෙස කළමනාකරණය කොට කාර්යක්ෂම හා ඵලදායී ලෙස මහජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම ඉතා ඉක්මනින් කළ යුතුව ඇත. අප සතුව ඇති එකතුන් සඳහා නව දුර්ලභ භාණ්ඩ එකතු කිරීමේ ප්‍රතිපත්තිය කුමක් ද යන්න ඉතා පැහැදිලිව නිශ්චය කිරීම අත්‍යවශ්‍යය. ජාතික කෞතුකාගාරවල භාණ්ඩ එකතුව ජාතික වශයෙන් ද ජාත්‍යන්තර වශයෙන් ද විශේෂ අවධානයට පාත්‍රවන ආකාරයට ශ්‍රී ලාංකීය අනන්‍යතාව පෙන්නුම් කරන සුවිශේෂ ගණයේ කෞතුක භාණ්ඩවලින් සමන්විත විය යුතු ය. අවශේෂ භාණ්ඩ අත්පත් කර නොගත යුතුය හෝ අත්හල යුතුය යන්න එයින් අදහස් නොකෙරේ. අවශේෂ කෞතුක වස්තූන් රාජ්‍ය භාරකාරත්වය යටතේ අදාළ ස්ථානවල තිබිය දී එවා රැකගැනීම, ප්‍රදර්ශනය සහ සංරක්ෂණය ආදී කටයුතුවල දී කෞතුකාගාරවල සේවාව සහ අධීක්ෂණය ලබාදිය යුතු ය. විශේෂයෙන් ම වර්ෂ 125 ක කාලයක තුළ දී අප විසින් එක්රැස් කරන ලද කෞතුක වස්තූන්ගෙන් වැඩි කොටසක් තවමත් ඇත්තේ ගබඩාවලය. එවා ඉතා විශිෂ්ට තත්ත්වයේ සංස්කෘතික හා ස්වභාවික විද්‍යාත්මක සාක්ෂිය. මෙවන් අතිවිශාල ප්‍රමාණයක කෞතුක වස්තු මහජනයාට ප්‍රදර්ශනය වශයෙන් ඉදිරිපත් කිරීමේ ප්‍රබල අභියෝගයකට ශ්‍රී ලංකාවේ ජාතික කෞතුකාගාර මුහුණ දී තිබේ. ප්‍රදර්ශනය කිරීම සහ විද්‍යානුකූලව නිසි ලෙස ගබඩා කිරීම පිළිබඳ තවමත් ගැටළු තිබේ. අපට තිබෙන සම්පත් ප්‍රමාණය මූල්‍ය ප්‍රතිපාදන, ඉඩකඩ සීමාවීම වැනි කාරණා මීට ප්‍රධාන වෙයි.

## කෞතුක භාණ්ඩ මිල දී ගැනීම

ජාතික කෞතුකාගාරවලට කෞතුක භාණ්ඩ හෝ භාණ්ඩ එකතුන් මිලදී ගැනීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්තියක් අවශ්‍යය. එය මිලදී ගැනීම සඳහා තීරණය කරන මිල කමිටුවක් සිටීම මෙහි දී ඉතා වැදගත්ය. මේ හැරුණු විට ජාතික කෞතුකාගාර කෞතුක භාණ්ඩ එකතුවට භාණ්ඩ තෑග වශයෙන් ලබා ගැනීමේ ප්‍රතිපත්තියක් තිබීම ද වැදගත්ය. වර්තමානයේ බොහෝ උදවිය තමන්ට නඩත්තු කළ නොහැකිකම නිසා පරම්පරාවෙන් හිමි වූ විවිධ භාණ්ඩ කෞතුකාගාරවලට පරිත්‍යාග කිරීමට උත්සාහ දරති. මෙවැනි භාණ්ඩ එකතූන කෞතුකාගාරවල භාරකාරීත්වය යටතේ සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙලක් තිබීම අත්‍යවශ්‍යය. මේ හැරුණු කොට ජාතික කෞතුකාගාරවල ක්ෂේත්‍ර වාර්තාවල දී හඳුනාගන්නා කෞතුක භාණ්ඩ අත්පත් කර ගැනීමේ නීතිමය තත්ත්වයක් නොමැති වීමෙන් කෞතුකාගාර නිලධාරීන් මහත් අපහසු තත්ත්වයට පත්වේ. එහෙයින් පෞද්ගලික වශයෙන් ඕනෑම ස්ථානයක තිබෙන කෞතුක වස්තුවක භාරකාරීත්වය පවතින්නේ කාට ද යන්න පිළිබඳවත්, මෙතෙක් ජාතික කෞතුක වස්තු එකතුවට අයත් නොවූ එකතූන් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන නීතිමය ප්‍රතිපාදන අත්‍යවශ්‍යය.

## සංරක්ෂණය

ශ්‍රී ලංකාවේ කෞතුකාගාරවල ඇති ජාතික උරුම සම්පත් සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් ද අපගේ විශේෂ අවධානය යොමුවිය යුතුය. ඕනෑම කෞතුකාගාරයක් යම් කුමන ක්‍රමයකින් හෝ ලැබුණු කෞතුක වස්තුවක හෝ ස්වභාවික විද්‍යා ආදර්ශකයක් නිරන්තර සංරක්ෂණයට භාජනය කළ යුතුය. පූර්ව සංරක්ෂණ කටයුතු, සංරක්ෂණ ප්‍රතිකර්ම, පශ්චාත් සංරක්ෂණ කටයුතු යන අවස්ථා පිළිබඳ නිශ්චිත වාර්තා තබා ගනිමින් සංරක්ෂණ කාර්යය ඉටුකළ යුතුය. සංරක්ෂණයේ මූලික භාරය වනුයේ කෞතුක භාණ්ඩ හෝ ස්වභාවික විද්‍යා ආදර්ශකවල භායන තත්ත්වය මර්දනය කොට ඒවායේ ආයු කාලය දීර්ඝ කිරීමයි. එහෙයින් කෞතුක සහ ස්වභාවික විද්‍යා ආදර්ශක සංරක්ෂණය කිරීම ඕනෑම අයකුට කළ හැකි කාර්යයක් නොවේ. එහෙයින් සංරක්ෂණ වේදීන් විද්‍යානුකූල සංරක්ෂණ ක්‍රමවේදයන් ගැන මනා පුහුණුවක් ඇති හා අදාළ වස්තූන් සම්බන්ධ විෂයානුබද්ධව යම් දැනුමක් ඇති අය ද විය යුතු ය. ජාතික කෞතුකාගාරවල උරුම සම්පත් ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කරන විට නැතැද්දී පවත්නා සංරක්ෂණ කාර්යයන් සඳහා අප සතුව ඇති නිලධාරීන් සහ සේවක මණ්ඩලය කිසිසේත් ප්‍රමාණවත් නොවන බවයි. එක් එක් කෞතුක වස්තූන් සහ ස්වභාවික විද්‍යා ආදර්ශක සංරක්ෂණය කිරීමට ප්‍රවීණතාවක් ලද සංරක්ෂණ වේදීන්ගෙන් යුක්ත කාර්ය මණ්ඩලයක් අත්‍යවශ්‍යය. එසේම ඒ ඒ කෞතුක වස්තූන් හා ස්වභාවික විද්‍යා ආදර්ශක සංරක්ෂණය කිරීමේ දී යෙදිය යුතු රසායනික ද්‍රව්‍යය, අප විසින් අනුගමනය කළ යුතු සංරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ ප්‍රතිපත්තියක් තිබීම අවශ්‍යය. ජාත්‍යන්තර වශයෙන් ලෝකයේ දියුණු රටවල සංරක්ෂණ ක්ෂේත්‍රයන්හි ඉතා වේගයෙන් නව සොයා ගැනීම් සිදු කරන බැවින් එකී තත්ත්වයන්ට අනුව කටයුතු කළ හැකිවන පරිදි නිලධාරීන් පුහුණු කළ යුතු ය. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති කෞතුකාගාර පිහිටුවා තිබෙන බොහොමයක් ගොඩනැගිලි වසර 100 සිට 400 ක් තරම් පැරණි තත්ත්වයේ ඒවාය. එහෙයින් එම ගොඩනැගිලි ද පුරා ස්මාරක ගණයෙහිලා සැලකිය හැකිය. ඒවා ද සංරක්ෂණය කළ යුතු මට්ටමේ පවතී. මේ නිසා ජාතික කෞතුකාගාරවල සමස්ත සංරක්ෂණ ක්‍රියාවලිය ම ප්‍රවීණත්වයක් ලද ජාතික සංරක්ෂණ උපදේශක මණ්ඩලයක අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය. ජාතික කෞතුකාගාරවල තිබෙන සියලුම කෞතුක භාණ්ඩවල සංරක්ෂණ ප්‍රතිකර්ම ඉතිහාසය පිළිබඳ වාර්තා අත්‍යවශ්‍යය. වර්තමාන ලෝකයේ බොහෝ රටවල කෞතුක වස්තු සංරක්ෂණය කිරීම පිළිබඳ පරිගණක වැඩසටහන් සම්පාදනය කර ඇති අතර, ඒ එක් එක් කෞතුක භාණ්ඩයක හෝ ස්වභාවික විද්‍යා ආදර්ශයක සංරක්ෂණ ප්‍රතිකර්ම වාර්තා ඉතා ඉක්මනින් ලබා ගත හැකි අතර, ඒවා අඛණ්ඩව පරීක්ෂාවට ද භාජනය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෞතුකාගාරවල සංරක්ෂණ තත්ත්වයන් තව දුරටත් දියුණු කළ යුතුව ඇත. මුළු මහත් රටේ ම ඇති කෞතුක වස්තු සහ ස්වභාවික විද්‍යා

ආදර්ශක සංරක්ෂණය කිරීමේ කාර්යභාර්ය දෙපාර්තමේන්තු නිලධාරීන්ට ඉටු කළ නොහැකි තරම් ය. එහෙත් ඒ කුමන ස්ථානයක තිබෙන භාණ්ඩයක් වුව ද ඒ ස්ථානයේ තිබිය දී ඒවායේ හායන කාරක නිර්ණය කිරීම සඳහා සංරක්ෂණ ප්‍රතිකර්ම හා නඩත්තු කිරීම පිළිබඳ උපදෙස් ලබාදීමේ වැඩ පිළිවෙළක් කෞතුකාගාරවලින් ක්‍රියාත්මක වීම අවශ්‍යය.

## ප්‍රදර්ශනය

කෞතුකාගාරයක කාර්යභාර්ය අතර ඉතා වැදගත් වූ ද ඉතා උත්සාර වූ ද කාර්යය වනුයේ ප්‍රදර්ශනය යි. කෞතුකාගාර ප්‍රදර්ශනය යනු හුදෙක් අලංකාර සැරසිලි සහ වර්ණ රටා ගැලපීමක් ම පමණක් නොවේ. කිසියම් ජන සමාජයක ස්වභාවික හා සංස්කෘතික උරුමයට අදාළ තොරතුරු හා ඊට අදාළ විවිධ අවස්ථාවන්ට සම්බන්ධ තත්ත්වයන් අප සතුව තිබෙන භාණ්ඩ මගින් ප්‍රතිනිර්මාණය කර පෙන්වීමේ ප්‍රබල අභියෝගය ප්‍රදර්ශන සැලසුම්කරුවනට තිබේ. එහෙයින් ප්‍රදර්ශන සැලසුම් ශිල්පීන් උසස් ප්‍රවීනත්වයකින් හෙබි කෞතුකාගාර වෘත්තීය පිළිබඳ දැනුමක් ඇති අය විය යුතු ය. කෞතුකාගාරය ප්‍රදර්ශනය යනු එක් රැක් බැදිරි සැලසුම් කිරීම පමණක් නොවේ. තමන්ට ලැබෙන ගොඩනැගිල්ලක අභ්‍යන්තරය කෞතුක භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා සුදුසු පරිදි සකස් කිරීමට ද, සිදුවන නිසා ඇතැම් විටෙක වාස්තුවිද්‍යාත්මක කාර්යයන් පිළිබඳව පවා දැනුමක් ඔවුන්ට තිබිය යුතුය. කොතරම් ප්‍රවීණතාවක් ලද අත්දැකීම් බහුල ප්‍රදර්ශන සැලසුම්කරුවෙකු වුව ද ඒ ඒ කෞතුකාගාර භාරකරුවන් සහ ඊට අදාළ සංරක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් ද තම ප්‍රදර්ශන සැලසුම්වල දී පිළිපැදිය යුතු ය. ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ප්‍රදර්ශන ක්‍රමවේදය පිළිබඳ තත්ත්වය එතරම් හොඳ තත්ත්වයක ඇතැයි යන්න සතුටු විය නොහැක. බොහෝ විට කෞතුකාගාරවල ප්‍රදර්ශන සැලසුම් කටයුතු ඉටු කරනු ලබන්නේ අන් ක්ෂේත්‍රවල ප්‍රදර්ශන කටයුතු සඳහා යොමුවුණු පුද්ගලයින් විසිනි. නූතන තාක්ෂණය සමඟ ශ්‍රී ලංකාවේ සියලු ම කෞතුකාගාරවල ප්‍රදර්ශන දියුණු කළ යුතු ය. අප සතුව ඇති අගනා කෞතුක වස්තු එකතුන් නියෝජනය කරන යුගය හා එම පරිසරය ප්‍රති නිර්මාණය කොට නරඹන්නාත් තුළ ආශ්වාදයක් ඇති කිරීම වෙනුවෙන් උපරිම තාක්ෂණ ක්‍රමවේදයන් භාවිත කරමින් අපගේ ප්‍රදර්ශන ක්‍රම වෙනස් කළ යුතුය. බොහෝ විට ලංකාවේ කෞතුකාගාරවලට පැමිණෙන නරඹන්නන්ගේ ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා නූතන තාක්ෂණ ක්‍රම කෞතුකාගාර මගින් භාවිත කළ යුතු අතර, නරඹන්නන්ට උපරිම වශයෙන් දැනුම, ආශ්වාදය සහ සතුට සැලසෙන අයුරින් කෞතුකාගාරවල ප්‍රදර්ශන සකස් විය යුතු ය. ක්‍රමවත් සිත් ඇදගන්නා සුළු කෞතුකාගාර ප්‍රදර්ශන රටක ජාතික අධ්‍යාපනයෙහි ලා ඉතා භාරදූර කාර්යයක් ඉටු කරයි. එහෙයින් මේ සඳහා වෘත්තීයමය වශයෙන් දැනුමැති ප්‍රදර්ශන සැලසුම් ශිල්පීන්ගෙන් යුත් කණ්ඩායමක් ජාතික කෞතුකාගාරවලට අවශ්‍යය.

## අධ්‍යයන හා පර්යේෂණ

ලෝකයේ රාජ්‍ය මට්ටමින් කෞතුකාගාර ඇරඹී මුල් අවධියේ වූයේ කලා රසික බව හා තම අතීත ජන සමාජ සම්බන්ධයෙන් වූ පෞරාණික මෙන් ම ප්‍රෞඪ බව අධ්‍යයනය කිරීමේ ප්‍රවණතාවකි. එහෙත් 19 වන සියවසේ මුල් භාගයේ සිට කෞතුකාගාර, සමාජයේ විවිධ කණ්ඩායම් සඳහා අධ්‍යයනය ලබා දෙන විද්‍යාස්ථාන බවට පත්විය. ඒ අනුව කෞතුකාගාර හුදෙක් විනෝදාස්වාදය සපයන ආයතන නොව උගතුන්ට, විද්වතුන්ට තම අධ්‍යයන හා පර්යේෂණ සඳහා අවශ්‍ය කරන විද්‍යාත්මක තොරතුරු සපයන ආයතන බවට පත්විය. කෞතුකාගාරයකින් ලැබෙන අධ්‍යාපනය විවිධාකාරය. එය මූලික වශයෙන් ම ප්‍රදර්ශනය නරඹා ලැබෙන බව සත්‍යයකි. එහෙත් ඒ එක් එක් කෞතුක වස්තූන් එකතූන් පිළිබඳ විවිධ විස්තර අඩංගු ලේබල් මගින් ද ඒ පිළිබඳ තොරතුරු කියාදීමෙන් ද නරඹන්නන්හට නිසියම් දැනුමක් ලැබේ. මේ හැරුණු විට අප සතුව ඇති විවිධ කෞතුක වස්තු එකතූන් පිළිබඳ නාමාවලිය සහ ප්‍රකාශන කුඩා අත් පත්‍රිකා ආදිය මගින් ද තොරතුරු ලබා දෙයි. එමෙන් ම අධ්‍යයන වැඩමුළු, සම්මන්ත්‍රණ සහ දේශන ආදිය ද කෞතුකාගාර අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි. ඉහතින් අප සඳහන් කළ විවිධ වැඩ සටහන් සම්පාදනය කිරීම සඳහා ඒ පිළිබඳ දැනුමැති අධ්‍යාපන නිලධාරීන් කෞතුකාගාරවලට අත්‍යවශ්‍යය. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන හා ප්‍රකාශන අංශ විශ්වවිද්‍යාලයකින් ඉටු කරන විවිධ ශාස්ත්‍රීය කරුණු පිළිබඳව සංවාදශීලී අදහස් හුවමාරු කරගන්නා අංශයක් හැටියට දියුණු කළ යුතු ය.

කෞතුකාගාර අධ්‍යාපනය යනුවෙන් අදහස් කෙරෙනුයේ ඒ ඒ විෂයානුබද්ධ දැනුම ලබාදීම පමණක් නොව විවිධ ජාතීන් අතර විවිධ කණ්ඩායම් අතර සහයෝගීතාව සහ සමගිය වර්ධනය කිරීම වෙනුවෙන් අතිමහත් කාර්යයක් ඉටු කළ හැකි විෂයකි. කෞතුකාගාරයක අධ්‍යාපන අංශයේ නිලධාරීන්ගේ කැපවීම, හැකියාව සහ උනන්දුව මත ඒ ඒ කෞතුකාගාර මහජනතාව නිතර පැමිණෙන, විවිධ සම්බන්ධතා පවත්වනු ලබන සමාජයට අවශ්‍ය ආයතන බවට පත්වනු ඇත. කෞතුකාගාර අධ්‍යාපන නිලධාරීන් විසින් නිතර සමීක්ෂණ පවත්වා නරඹන්නන්ගේ රුචිකත්වය සහ අවශ්‍යතාවන් තේරුම් ගෙන ඊට උචිත වැඩසටහන් සැලසුම් කිරීම කෞතුකාගාරවලට ඉතා වැදගත් ය. ලෝකයේ ඉතා සීඝ්‍ර ලෙස විපර්යාසයට බඳුන් වෙමින් පවතින සංස්කෘතික හා ස්වභාවික උරුමය පිළිබඳ ජනතාව දැනුවත් කර ඒ වෙනුවෙන් මහජනතාව අතර සංවාදයක් ඇති කළ හැකි හොඳම ස්ථානයකි කෞතුකාගාරය. කෞතුකාගාරවලින් ඉතා පහසුවෙන් මෙම පණිවිඩය මහජනතාව වෙත ලබා දිය හැකි ය. මේ හැරුණු විට විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය සමඟ නිරන්තර සබඳතාවක් ගොඩනගා ගනිමින් අධ්‍යාපනික වශයෙන් පමණක් නොව විනෝදාස්වාදය සඳහා වූ වැඩසටහන් ද

ප්‍රවිශාකය කළ හැකි ය. විශ්වවිද්‍යාලවල විවිධ වූ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය කරන විද්‍යාත්මක තොරතුරු ගබඩා වී ඇත්තේ කෞතුකාගාරවලය. කෞතුකාගාරවල කාර්යභාරයන්ගේ එක් කොටසක් නම් තම කෞතුක වස්තු එකතුන් පර්යේෂණයන්ට භාජනය කරමින් එමගින් අනාවරණය කරගන්නා තොරතුරු ජාතිකව හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමයි. එමගින් විශ්වවිද්‍යාල සඳහා අවශ්‍ය කරන පර්යේෂණ වැඩසටහන් සම්පාදනය කිරීමට අධ්‍යාපන විෂයයකි ලා කෞතුකාගාරවලට විශාල මෙහෙයක් ඉටු කළ හැකි ය.

## ලේඛනගත කිරීම

කෞතුකාගාර ප්‍රදර්ශනවල සහ ගබඩාවල සුරක්ෂිතව තැන්පත් කර ඇති ජාතික උරුම සම්පත් විධිමත්ව ලේඛනගත කොට තිබීම ද ඒවා අදාළ ලේඛන හා ලිපි ගොනු යාවත්කාලීන කිරීම ද ඉතා වැදගත්ය. ජාතික වශයෙන් ද ජාත්‍යන්තර වශයෙන් ද පිළිගත් ප්‍රමිතියක් යටතේ සියලු දෙනාටම තේරුම් ගත හැකි පරිදි තොරතුරු ලේඛනගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කළ යුතුය. ලංකාවේ සියලුම ජාතික කෞතුකාගාරවල තැම්පත්ව ඇති කෞතුක භාණ්ඩ ලේඛන ගත වී ඇති අතර, මුල් කාලයේ දී අදාළ කෞතුක භාණ්ඩ පිළිබඳ එතරම් විස්තර අඩංගු නොවුන ද 70 දශකයේ සිට මේ දක්වා අත්පත් කරගත් කෞතුක භාණ්ඩවල උපරිම තොරතුරු දක්වීමට කෞතුකාගාර බලධාරීන් උත්සාහ ගෙන ඇත. කෞතුකාගාරවල තිබෙන කෞතුක භාණ්ඩ අවස්ථා කිහිපයක දී ලේඛන ගතවීම හඳුනාගත හැකි ය. කෞතුක භාණ්ඩයක් අත්පත් කරගත් විගස එය මධ්‍යම ලේඛනයක ලේඛනගත කෙරෙන අතර, අනතුරුව එකී කෞතුක භාණ්ඩ අදාළ අංශ වෙත යැවෙනු ඇත. ඒ ඒ අංශවල තැම්පත් එම කෞතුක භාණ්ඩය ආංශික ලේඛනවල ලියාපදිංචි කෙරෙනු ඇත. අදාළ අංශයේ අනුමැතිය ඇතිව එම කෞතුක භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ විට ඒ සෑම කෞතුක භාණ්ඩයක් ම ප්‍රදර්ශන භාණ්ඩ ලේඛනයේ ලියාපදිංචි කෙරෙනු ඇත. මීට අමතරව ඒ ඒ අංශවලත් ඒ ඒ කෞතුකාගාරවලත් ලිපි ගොනු, නාමාවලි, සූචි පත්‍ර, ආදී විවිධ ක්‍රම මගින් කෞතුක භාණ්ඩ ලේඛනගත වීම හඳුනා ගත හැකිය. කෞතුක භාණ්ඩ එකතුන් වශයෙන් හා එක් එක් කෞතුක භාණ්ඩය බැගින් අවස්ථා ගණනක දී ලේඛන ගත වී තිබීම අධ්‍යයන හා පර්යේෂණවල පහසුව ඇති කරන අතර, එමගින් ඒ ඒ කෞතුක භාණ්ඩවලට නීතිමය ආවරණය සැලසේ.

## නිගමනය

වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල කෞතුක භාණ්ඩ පරිගණක ආශ්‍රයෙන් ලේඛනගත කිරීමෙන් අන්තර්ජාලය හා වෙබ්අඩවි හරහා ඉතා කෙටි කාලයක තුළ දී ලෝකයේ ඕනෑම රටක සිටින අයෙකුට අදාළ තොරතුරු ලබා ගැනීමේ පහසුකම් ද

පළසා තිබේ. ශ්‍රී ලංකාවේ කෞතුකාගාරවල ඇති සියලු ම ජාතික උරුම සම්පත් පිළිබඳව කාර්යක්ෂම තොරතුරු ලබාදීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම ද සමස්ත කෞතුකාගාර ක්ෂේත්‍රයම පුනිසංවිධානය කිරීම සඳහා ද අපගේ අවධානය යොමු විය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


| | | |
|---|---|---|
| Dean, D | 1994 | *Museum Exhibition, Theory & Practice,* Rout ledge London. |
| Larra Bee, E | 1968 | *Museum & Education,* Institute Press Washington D.c |
| Neustupny, J | 1968 | *Museum & Research,* Par ague |
| Olofsson, U. K | 1979 | *Museum & Children,* Paris, Unesco. |
| රණවීර. එම් | 1978 | *කෞතුකාගාර සියවස,* (විශේෂ ලිපි II ජාතික අධ්‍යාපනයෙහි ලා කෞතුකාගාර ඉටු කළ යුතු වැඩ කොටස), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව. කොළඹ. |
| දැනේරු, ඇස් | 1977 | *කෞතුකාගාර සියවස,* (විශේෂ ලිපි IV ශාස්ත්‍රාලයීය තත්ත්වයේ සිට කාර්මික සමාජයක් කරා සීඝ්‍ර ලෙස වර්ධනය වන රටවල සංස්කෘතික, අධ්‍යාපනික, ආර්ථික හා තාක්ෂණික සංවර්ධනය සම්බන්ධයෙන් කෞතුකාගාර සතු කාර්යභාරය) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ. |
| සිල්වා, ඊ. එච්. ඩී. එච් ද | 1977 | *කෞතුකාගාර සියවස,* ජාතික කෞතුකාගාරය, කොළඹ. |
| සිල්වා, පී. එච්. ඩී. එච් ද | 1969 | *ලංකාවේ අධ්‍යාපන සියවස,* (කෞතුකාගාර අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, කොළඹ. |